

# කතෘගෙන්

නවීන කෘෂිකාර්මික ක්‍රමයන් ක්‍රියාවේ යෙදීමේදී බෝග වගාවන් කෙරෙන ගොවිපළවල් තුළ සතුන් ඇති කිරීමේ ව්‍යාපාරයන් ද තිබිය යුතු බැව් ලෝකයේ සියලු දෙනාම පිළිගත් ඉතා වටිනා මතයකි. මේ මගින් පසේ සාරවත් බව වැඩිකල් පවත්වා ගත හැක.

සතුන් ඇති කිරීමේ දී සතුන්ට වැළඳෙන භයානක රෝගවලට පිළියම් කිරීමට ගොවියා දැන සිටිය යුතු අතර වීරස හා බැක්ටීරියා මගින් බෝවන භයානක් රෝග ගණනාවකින් සතුන් මුදවා ගැනීම උදෙසා සතුන් එන්නත් කිරීමේ මනා වැඩ පිළිවෙළක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කොට ඇති බැවින් තම තමන්ගේ සතුන් රෝගවලින් මුදවා ගැනීම ගොවියන් සතු වග කීමකි.

ලංකාවේ විශේෂයෙන් ම වියළි කලාපයේ පවතින දේශගුණික තත්ත්වයන් යටතේ අපේ ජනගහණයෙන් වැඩි කොටසක් මාංසජනක ධාතු නොමැති කමින් මන්ද පෝෂණයෙන් පෙළෙන බවට කරුණු සොයාගෙන ඇත. එබැවින් කිරි දෙනුන් හා කුකුළන් ඇති කිරීමෙන් ගොවියාට මෙන්ම ඔහුගේ දූදරුවන්ටත් යහපතක් ම සිදුවන බැව් සක් සුදක් සේ පැහැදිළිය. එබැවින් ඒ සඳහා ගොවියා විසින් දියුණු කරන ලද දෙමුහුන් කිකිළියන් වැනි උසස් වර්ගවල සතුන්ම ඇති දැඩි කළ යුතු බැව් නොකිවමනාය. මේ සඳහා ගොවියන් විසින්, දෙපාර්ත මේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන කෘත්‍රිම ජනන සේවයෙන් යොදා ඇති පහසුකම් මගින්, තමන්ගේ ගව රැලට නව සතුන් වර්ග ඇතුළු කොට ගව සම්පත දියුණු කර ගැනීමද ක්‍රියාවේ යෙදිය හැකි එක් මගකි. තවද, සතුන්ගේ රෝගවලට ප්‍රතිකාර කිරීම උදෙසා කුඩා පශු රෝහල් සෑම දිස්ත්‍රික්කයකම වාගේ පිහිටුවා ඇත. ඒවාද, පිහිටුවා ඇත්තේ මහාජනයාගේ ශුභ සිද්ධිය සඳහා ම මිස අන් කිසි කරුණක් නිසා නොවේ.

සතුන්ට වැළඳෙන රෝග මෙන්ම උන්ට අවශ්‍ය පෝෂ්‍යදයී ආහාර හා සැපසේ ජීවත්වීමට අවශ්‍ය නිවාස සැපයීම ආදිය ද, ඉතා වැදගත් වෙයි. එවැනි පෝෂ්‍ය දයි ආහාර පිළියෙළ කිරීමට උවමනා සහල් නිවුඩු හා පොල් පුන්නක්කු ආදිය මේ රට තුළ එමට ඇත. බඩඉරිඟු වුවද හැකිතරම් අපට වවාගතහැක. එහෙත් මෑතක සිට සත්ත්ව ආහාරවල මිළ අධික වී තිබීම කාගේත් සැලකිල්ලට යොමුවිය යුතුය. එමෙන්ම ගොවියාටඉතා පහසුවෙන් වගා කළ හැකි නියඟ යට පවා බොහෝ සෙයින් ඔරොත්තුදෙන '' බ්‍රැකේරියා, බ්‍රසැන්තා '' වැනි තෘණ වර්ග හා ගිනි හා නේපියර් වැනිවිශිෂ්ට තෘණ වර්ග වගා කිරීමෙන් අපමණ ප්‍රයෝජන අත්කර ගත හැකි වෙයි.

අපේ ගම්බද පෙදෙස්වලට ක්‍රමානුකූල ක්‍රමයට සැකසුන ගවගාල් හා කුකුළු ගෙවල් ආදිය බොහෝ සෙයින් ඇබ්බැහි වී නොතිබීම රටේ අභාග්‍යයකි. ගම් බද ඇති කුඩා පොල් ඉඩම් තුළ මෙන්ම විශාල පොල්වතුවලද, සතුන් ඇති කිරීම බොහෝ සාර්ථක ලෙස කළ හැකි බැව් කවුරුත් පාහේ දන්නා ඉතා පැහැදිළි කරුණකි. එබැවින් මේ සඳහා අවශ්‍ය වන්නේ ධනය, පරිශ්‍රමය, උනන්දුව හා කාර්යය සඳහා අවශ්‍ය ලැදියාවත් පමණි. මෙවැනි ක්‍රමානුකූල කුකුළු ගෙවල් බෞද්ධයන් වෙසෙන ගම්බද පළාත්වල ද සාර්ථක වන බවට මෙම සඟරාවේ අන්තැනෙක විස්තර වන ලද්දුව සතුන් ඇති කිරීමේ සමිතිය පිළිබඳ ලිපිය කදිම නිදසුනකි.

වැඩි වැඩියෙන් කිරි නිපදවීමෙන් කිරිවල මිළ පහත වැටී නිෂ්පාදකයාට පහර වැදේයයි සිතිය නොහැක. ඒ ලංකාවේ ඇති කරන්නට යන උකුකිරි කම්හලට හා පිටිකිරි කම්හලට විශාල කිරි ප්‍රමාණයක් අවශ්‍ය වන බැවිනි. එමෙන් ම ජනතාවගේ එදිනෙද ප්‍රයෝජනය සඳහා ද, පිරිසිදු එළකිරි තවත් බොහෝ අවශ්‍ය වනවා ඇත.

ගම්බද පළාත්වල කිකිළි බිත්තරයක් ශත 15–18 පමණ වන නමුදු නගරබද වැසියන්ට මේ සඳහා ශත 25ක්, පමණ අධික මිළක් ගෙවීමට සිදු වී ඇත. මෙම පැණය වඩාත් බැරෑරුම් වන්නේ බිත්තර නිෂ්පාදනය අධික කාලයටයි. එබැවින් නිෂ්පාදකයා මෙන් ම පාරිභෝගිකයා ද, පරිහාණියට පත් කෙරෙන මෙම අනවශ්‍ය වාතාවරණය ඉක්මණින් වෙනස් කළ යුතුව ඇත.

රජය සතුන් ඇති කරන අයට ඉඩම් ලබා දීමට මෙන් ම බදු සහනාධාර ඇති කිරීමට හා මේ සඳහා අවශ්‍ය උපකරණ පිටරටින් අඩු මිළට ගෙන්වීමේ බලතල හා වරප්‍රසාද වැනි පහසු කම් මහාජනයා වෙත දී ඇති මෙසමයේ ඉහත කී කරුණු ද සිත්හි තබාගෙන ලංකාව පුරාම විශේෂයෙන් පහත රට පොල්වගාවල මෙන් ම වියළි කලාපයේ හා උඩරට පළාත්වලද, තම ගෙවතු හා ගොවිපළවල් තුළ ද සතුන් ඇති කිරීම වහ වහා අරඹා රටේත් ජාතියේත් නව යුගයක් ඇති කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු.